# ජාතික රාජ්‍ය සභාවේ

# 1975 අංක 29 දරන බෞද්ධ ග්‍රන්ථ

# ප්‍රකාශන සමිතිය පනත

[සහතිකය සටහන් කළේ 1975 ජූලි මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1975 අගෝස්තු මස 15 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී).

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබා ගත හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 29 දරන බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය පනත

[සහතිකය සටහන් කළේ 1975 ජූලි මස 17 වන දින]

එල්.ඩී.—ඕ. 55/74.

**බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වන රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු එලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මහනුවර මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු කිපය මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කර ගෙන ගොස් ඇති හෙයින් සහ එම සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහාජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ:—

කෙටි නාමය.

1. මෙම පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 29 දරන බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය සංස්ථාගත කිරීම.

2. මෙම පනත ආරම්භ වන දින සිට හා ඉන් පසුව (මෙහි මින්මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතියේ තත් කාලයෙහි තිල දරන පාලක මණ්ඩලයේ සභාපති සහ එහි සාමාජිකයන් සහ සමිතියේ දැනට සාමාජිකයන් ව සිටින සියලු දෙනාම හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින්පසු බඳවා ගනු ලබන සාමාජිකයන් සියලු දෙනාම "බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය" යන නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන්නාහ. එකී "බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය" යන අභිධානය හා නාමය යටතේ එකී සමිතිය විසින් හා එයට විරුද්ධව ඕනෑම අධිකරණයක නඩු පැවරීම ද, නඩු පවරනු ලැබීම ද කළ හැකිය. තවද, පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා භාවිච්චි කිරීමට ද සිය කැමැත්ත පරිදි එම මුද්‍රාව වෙනස් කිරීමට ද එම සංස්ථාවට පූර්ණ බලය හා අධිකාරය ඇත්තේය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. මෙම සංස්ථාව සංස්ථාපනය කරන පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ ප්‍රකාශනය,

(ආ) බුද්ධ ධර්මය පිළිපැදීමේ උන්නතියක් ඇති කිරීම,

(ඇ) බුද්ධ ධර්මය විවිධ රටවල ප්‍රචාරය කිරීම, සහ

(ඈ) බෞද්ධ පුහසාධක වැඩ කටයුතුවලට සහ සහනාධාර කටයුතු වලට අනුබල දීම.

ඒ 09019—9,675 (74/08)

පාලක මණ්ඩලය.

4. (1) මෙහි පහත විධිවිධාන සලසා ඇති පරිදි, ඒ ඒ අවස්ථාවේ දී සංස්ථාව සම්බන්ධයෙන් බල පවත්වන රීතිවලට යටත්ව සංස්ථාවේ වැඩකටයුතු සභාපති, ගරු ලේකම්, ගරු සමලේකම්වරුන් දෙදෙනකු සහ ගරු භාණ්ඩාගාරික යන අයගෙන් සහ සංස්ථාව සම්බන්ධයෙන් ඒ ඒ අවස්ථාවේදී බල පවත්නා රීතිවලට අනුකූලව පත්කර ගනු ලබන සෙසු සාමාජිකයන් සිව් දෙනකුට වැඩි නොවූ සංඛ්‍යාවකගෙන් සමන්විත පාලක මණ්ඩලයක් විසින් පාලනය වන්නේ ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සියලු දෙනාම සංස්ථාව සම්බන්ධයෙන් ඒ ඒ අවස්ථාවේ දී බලපවත්නා රීතිවලට යටත් වන්නා හ.

(3) ප්‍රථම පාලක මණ්ඩලය පහත සඳහන් අයගෙන් සමන්විත වේ :—

ආරම්භක සභාපති : පූජ්‍ය ඤාණපොනික මහා ස්ථවිරයන් වහන්සේ.

ආරම්භක ගරු ලේකම් : රිචඩ් අබේසේකර මහතා.

ගරු සම ලේකම්වරු : පී. බී. මුදන්නායක මහතා සහ වී. බී. නාරන්පනාව මහතා.

ආරම්භක ගරු භාණ්ඩාගාරික : ඒ. ඇස්. කරුණාරත්න මහතා—සහ ඊ. එරමුදුගොල්ල මහතා සහ බ්‍රින්ඩ්ලි රත්වත්තේ මහතා.

රීති සෑදීමේ බලය.

5. වරින්වර, සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමකදී, සාමාජිකයන් බඳවා ගැනීම, ඉල්ලා අස්වීම හෝ නෙරපා හැරීම පිළිබඳවත්, පාලක මණ්ඩලයේ සහ සංස්ථාවට අයත් විවිධ නිලධාරීන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ වැඩ කටයුතු කර ගෙන යාම සඳහාත්, සංස්ථාවේ කටයුතු කිරීමේ කාර්ය පටිපාටිය, පොදු වශයෙන්, සංස්ථාවේ වැඩ කටයුතු පාලනය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම පිළිබඳවත් සංස්ථාව විසින් වැඩි ඡන්දයෙන් රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. මෙසේ සාදනු ලබන රීති මෙහි 7 වන වගන්තියේ සඳහන් නියමයනට යටත්ව එවැනිම සභා රැස්වීමකදී වෙනස් කිරීම ද එම රීතිවලට අභිනවයෙන් යමක් එකතු කිරීම ද එම රීති සංශෝධනය කිරීම ද නැතහොත් ප්‍රත්‍යාදිෂ්ට කිරීම ද කළ හැකි ය.

උපලේඛනයේ දැක්වෙන රීති, සංස්ථාවේ රීති වන බව.

6. ඉහත සඳහන් වගන්තියේ අඩංගු විධිවිධානවලට යටත්ව, මීට අමුණා ඇති උපලේඛනයෙහි දැක්වෙන රීති සියලු කාර්යයන් සඳහා සංස්ථාවේ රීති වන්නේ ය :

එසේ වුවද, මින් පසු යම් අවස්ථාවක සංස්ථාව විසින් අලුත් රීති සෑදීම හෝ උපලේඛනයෙහි දැක්වෙන හෝ මෙයින් පසු සංස්ථාව විසින් සාදනු ලබන කිසියම් රීතියක් වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම හෝ ඊට අභිනවයෙන් යමක් එකතු කිරීම හෝ ඒ කිසියම් රීතියක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ මෙම වගන්තියෙහි සඳහන් කිසිවකින් වැළැක්වෙතියි නොසැලකිය යුතු ය.

රීති සංශෝධනය කිරීම ආදිය.

7. මෙහි උපලේඛනයේ සඳහන් කිසිම රීතියක් හෝ මින් පසු සංස්ථාව විසින් සාදනු ලබන මොන යම් රීතියක් හෝ වෙනස් කිරීම, එම රීතිවලට අභිනවයෙන් යමක් එකතු කිරීම, එම රීති සංශෝධනය කිරීම, හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම සංස්ථාවේ මහා සභා රැස්වීමක් සඳහා පැමිණ සිටින සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයක් ඇතිව විනා සහ ඒ සංශෝධනය සඳහා පාලක මණ්ඩලයේ අනුමතිය කලින් ලැබී ඇත්නම් මිස නොකළ යුතු ය.

සමිතියෙන් ගෙවිය යුතු හා සමිතියට අයවිය යුතු ණය.

8. මෙම පනත ක්‍රියාත්මක වන අවස්ථාවේදී පවත්නා සමිතියේ සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතුය. තවද, සමිතියට අයවිය යුතු ණය සහ ගෙවිය යුතු සාමාජික මුදල්, මෙම පනතේ කාර්යයන් සඳහා, සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

9. යටත් පිරිසෙයින්, පාලක මණ්ඩලයේ, විධිමත් බලය ලත් සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිටදී විනා මොනයම් හෝ සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නො තැබිය යුතු ය. මුද්‍රාව තබන අවස්ථාවේ දී තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් එකී සාමාජිකයන් දෙදෙනා සාධන පත්‍රයෙහි අත්සන් කළ යුතු අතර, එසේ අත්සන් කිරීම යම් කිසිවකු සාක්ෂිකරුවකු වශයෙන් කරන අත්සන් කිරීමකට බාහිරව විය යුතු ය.

දේපළ සතුව සිටීමට සංස්ථාව සතු බලය.

10. මිලදී ගැනීමකින්, දීමනාවකින්, ත්‍යාගයකින් හෝ අන්තිම කැමති පත්‍රයකින් බුදල් බෑගැර කිරීමකින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන ඕනෑම චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට හා අයත්ව තබාගැනීමට නීතියෙන් සංස්ථාවට බලය ලැබෙන අතර, විකිණීම, උකස් කිරීම, බදුදීම, හුවමාරු කිරීම හෝ වෙනත් අයුරින් සුදුස්සක් කිරීම සඳහා සම්පූර්ණ බලතල ඇතිව මෙම පනතේ කාර්යයන් සඳහා, සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව, එකී සියලුම දේපළ සංස්ථාව සතුව තිබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

11. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුලත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නො වන්නේ ය.

## උපලේඛනය

නාමය.

1. බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය නමින් මෙම සමිතිය හැඳින් වේ.

ලිපිනය.

2. සමිතියේ කාර්යාලය, මහනුවර නගරයෙහි පිහිටුවිය යුත්තේ ය.

පරමාර්ථ.

3. (1) බෞද්ධ සාහිත්‍යය ග්‍රන්ථාරූඪ කොට බෙදා හැරීමෙන් ලොව පුරා බුද්ධ ධර්මය ප්‍රචාරය කිරීම සමිතියේ ප්‍රධාන පරමාර්ථය වේ. මෙම සමිතියට බෞද්ධ ශුභ සාධක සහ සහනාධාර කටයුතුවල නිරත වීමට ද හැකිය.

(2) සමිතියේ පරමාර්ථ ඉටු කිරීම අරභයා ග්‍රන්ථ, කුඩා පුස්තක, පත්‍රිකා ආදී වශයෙන් බෞද්ධ සාහිත්‍යය ප්‍රකාශනයට පත් කොට බෙදා හැරිය යුතුය. චක්‍රය, බෝපත් සහ දම්සක් යන නාමයන්ගෙන් හැඳින්වෙන වාර ප්‍රකාශන, අගනා ලේඛන කෘති ලැබෙන තාක් හා ඇති තාක් මුද්‍රණය කොට ප්‍රසිද්ධ කළ යුතුය.

සාමාජිකත්වය.

4. සමිතියේ පාලන කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාශීලීව කටයුතු කරන්නාවූද බෞද්ධාගමික වූද පුද්ගලයන්, සාමාජිකයන් වශයෙන් තෝරා පත්කර ගැනීම සඳහා සුදුස්සන් වේ. ඔවුන්ගේ සංඛ්‍යාව පහළොස් දෙනෙකුට සීමා විය යුතුය. ඔවුන් රු. 50 ක වාර්ෂික සාමාජික දායක මුදලක් ගෙවිය යුතුය. මහා සංඝයා වහන්සේ විසින් සාමාජික මුදලක් ගෙවිය යුතු නැත.

ග්‍රාහකයෝ.

5. රු. 25 ක වාර්ෂික දායක මුදලක් ගෙවීමෙන් ඕනෑම පුද්ගලයෙකුට වෙළුම, බෝපත් සහ දම්සක් යන ප්‍රකාශනවලට ග්‍රාහක විය හැකිය. එවැනි පුද්ගලයන් ආශ්‍රිත සාමාජිකයන් වශයෙන් හඳුන්වනු ලැබේ.

මහා සභා රැස්වීම.

6. සමිතියේ සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක් වසරකට එක් වරක් ඒ ඒ වර්ෂයේ මැයි 31 වැනි දිනට ප්‍රථම පැවැත්විය යුතු අතර, එහිදී පාලක මණ්ඩලය සහ නිලධාරීන් තෝරා පත්කර ගත යුතුය. මහා සභා රැස්වීමක ගණ පූරණය හත් දෙනෙකි.

නිලධාරි මණ්ඩලය.

7. නිලධාරි මණ්ඩලය පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතුය :— සභාපති, ප්‍රධාන ලේකම්, සම ලේකම්වරුන් දෙදෙනෙක් සහ භාණ්ඩාගාරික වරයෙක්. වාර්ෂික මහා සභාරැස්වීමේදී ඔවුන් පත්කර ගත යුතුය. සභාපතිවරයා ප්‍රධාන කතෘද වන්නේය.

මහා සභා රැස්වීම පිළිබඳව දැනුම්දීම.

8. (1) මහා සභා රැස්වීම පැවැත්වීමට නියමිත දිනට සවත් පිරිසෙයින් දින පහළොහකට පෙරාතුව ප්‍රධාන ලේකම් විසින් ඒ පිළිබඳව සාමාජිකයන්ට ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දිය යුතුය.

ව්‍යවස්ථා සංශෝධන සහ යෝජනා.

(2) යම් යෝජනාවක්, සංශෝධනයක් හෝ අභිනවයෙන් ව්‍යවස්ථාවලට එකතු කිරීමක් හෝ සමිතියේ වැඩ කටයුතුවලට අදාළ යෝජනාවක් හෝ වේනොත් මහා සභා රැස්වීම පැවැත්වීමට, සවත් පිරිසෙයින් දස දිනකට පෙරාතුව, ප්‍රධාන ලේකම්ට භාර දිය යුතු අතර, ප්‍රධාන ලේකම් විසින් ඒ පිළිබඳව මහා සභා රැස්වීම පැවැත්වීමට අඩු වශයෙන් දින පහකට පෙරාතුව සාමාජිකයන්ට දැනුම් දිය යුතුය.

පාලක මණ්ඩලය.

9. (1) 7 වැනි ව්‍යවස්ථාවෙහි සඳහන් නිලධාරි මණ්ඩලයෙන් හා මහා සභා රැස්වීමකදී තෝරා පත් කැරෙන සාමාජිකයන් සිව් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් පාලක මණ්ඩලය සමන්විත වන්නේය. පාලක මණ්ඩලයෙහි යම් පුරප්පාඩුවක් ඇතිවුවහොත්, මණ්ඩලය විසින් සාමාජිකයන් අතුරෙන් කෙනෙකු ඒ සඳහා පත් කළ යුතු වන්නේය. පාලක මණ්ඩලය තෙමසකට වරක් හෝ ලේකම් විසින් රැස්වීමක් කැඳවූ විටෙක හෝ රැස්විය යුත්තේය. රැස්වීමකට පැමිණ සිටින සෑම සාමාජිකයකුටම ඡන්දයක් හිමි වේ. පාලක මණ්ඩලයේ රැස්වීමක ගණ පූරණය පස් දෙනෙකි.

(2) සමිතියේ ජංගම ගිණුම සහ තැන්පතු ගිණුම භාරකරුවන් දෙදෙනෙකු විසින් මෙහෙය විය යුතු අතර, ගරු භාණ්ඩාගාරික ඉන් එක් භාරකරුවෙක් විය යුතුය.

අරමුදල්.

10. (1) පහත නම් සඳහන් අය සමිතියේ අරමුදල්වල ප්‍රථම භාරකරුවන් විය යුතුය :—

ගරු භාණ්ඩාගාරික : ඒ. ඇස්. කරුණාරත්න මහතා ;

ගරු ප්‍රධාන ලේකම් : පිටර් අබේසේකර මහතා ; සහ

ගරු සම ලේකම් : පී. බී. මුදන්නායක මහතා.

භාරකාර මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් ඇති වුවහොත් පාලක මණ්ඩලය විසින් එහි සාමාජිකයන් අතුරෙන් කෙනෙකු ඒ සඳහා පත් කළ යුතුය.

(2) අනුමත කළ එක් බැංකුවක හෝ ඊට වැඩි බැංකු ගණනාවක හෝ සමිතියේ අරමුදල් තැන්පත් කළයුතු අතර, සමිතියේ අභිමතාර්ථ සංසිද්ධිය සඳහා පමණක් එම මුදල් වියදම් කළ යුතුය. සමිතියේ බැංකු ගිණුම භාරකරුවන් දෙදෙනෙකු විසින් මෙහෙයවිය යුතු අතර, ඉන් එක්කෙනෙක් ගරු භාණ්ඩාගාරික විය යුතුය.

(3) පාලක මණ්ඩලයේ අභිමතය පරිදි සමිතියේ අතිරික්ත අරමුදල්, මණ්ඩලය විසින් අනුමත කළ සුරැකුම්වල හෝ සමිතියේ අභිමතාර්ථ සංසිද්ධිය සඳහා තැනෙන මූලස්ථානයක් ඉදි කිරීම සඳහා ද ආයෝජනය කළ හැකිය.

**ගිණුම් සහ ගණන් පරීක්ෂණය.**

11. (1) භාණ්ඩාගාරික විසින් ගිණුම් පවත්වා ගෙන යායුතු අතර, ගිණුම් පොත් ඔහු භාරයේ තැබිය යුතුය. විධිමත් ලෙස පරීක්ෂිත ගිණුම් වාර්තාවක් අනුමතිය සඳහා වාර්ෂිකව මහා සභාවට ඉදිරිපත් කළ යුතුය. වාර්ෂික මහා සභා රැස්වීමේදී පාලක මණ්ඩලය විසින් ගණන් පරීක්ෂකවරුන් පත් කළ යුතුය.

(2) කාර්යාල වේලාවන් තුළ කාර්යාලයේ දී, ඕනෑම සාමාජිකයකුට සමිතියේ ගිණුම් පොත් පරීක්ෂා කර බැලිය හැකිය.

**පාලනය.**

12. සමිතියේ සියලුම කටයුතු පාලක මණ්ඩලය විසින් කළමනාකරණය හා පාලනය කළ යුතුය.

**සාමාජිකයන් ඉවත් කිරීම.**

13. යම් සාමාජිකයකුගේ ක්‍රියා කලාපය සමිතියේ යහපතට හිතකර නොවන්නේ යයි මණ්ඩලය අදහස් කරන්නේ නම්, මණ්ඩලයේ සාමාජිකයන්ගේ රැස්වීමකදී වැඩි ඡන්දයෙන් සම්මත කෙරෙන යෝජනාවක් මගින් එකී සාමාජිකයාගේ නම සාමාජික ලැයිස්තුවෙන් ඉවත් කළ හැකිය.

**මතභේද.**

14. සාමාජිකයන් අතර ඇතිවන මතභේදයන් සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමකදී පත් කෙරෙන බේරුම්කරුවකු විසින් හෝ බේරුම්කරුවන් විසින් හෝ බේරුම්කරුවන් එක් අයකුට වැඩි සංඛ්‍යාවක් පත්කර ඇතොත් ඔවුන් විසින් පත් කෙරෙන තීරකයකු විසින් සමථයකට පත් කළ යුතුය.

**විධිවිධාන සලසා නොමැති කරුණු.**

15. මෙකී ව්‍යවස්ථාවලින් විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් පාලක මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වන්නේ ය.

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත් වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි, (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.